## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/251/2024 (NPC)

ජේ.එම්.එස්.ශාන්ත ජයසුන්දර,
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.11.**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

### විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක ජේ.එම්.එස්.ශාන්ත ජයසුන්දර යන අය විසින්, **2024.11.12** වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහු විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කර ඇති හෙයින්, ඔහු වෙත පනවා ඇති දඬුවම් සියල්ල ඉවත් කර දෙන ලෙසටය. එසේ අභියාචක වෙත දඬුවම් පමුණුවා ඇත්තේ, සබරගමුව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ **2023.03.31** දිනැති ලිපිය මගිනි. එම ලිපියට අනුව අභියාචක වෙත ඉදිරිපත් කර ඇති චෝදනා **05**ටම ඔහු වරදකරු කරමින්, ඔහුගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කර ඇත. ඊට අමතරව, වරද සිදුකළ දිනයේ සිට ඉදිරියට වසර **05**ක් ගතවන තෙක් කිසිදු උසස්වීම් පරීක්ෂණයකට පෙනී සිටීමට අභියාචක නුසුදුස්සෙකු බවට පත්කර ඇත. ඒ හැරෙන්නට අභියාචක වැඩ තහනම්ව සිටි කාලය වැටුප් රහිත, සක්‍රීය නොවන කාලයක් සේ සැලකීමටද

නියෝග කර ඇත. එම විනය නියෝගයට එරෙහිව අභියාචක ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඔහුගේ අභියාචනය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිෂ්ප්‍රභ කර ඇත. එම තීරණය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අභියාචක වෙත එවා ඇති 2024.10.25 දිනැති ලිපියේ සඳහන් වේ. ජාතික පොලිස් කොමිෂන් සභාව අභියාචකගේ අභියාචනය නිෂ්ප්‍රභ කර ඇති හෙයින්, ඔහු විසින් මෙම අභියාචනය මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත.

අභියාචකට එරෙහිව චෝදනා පහක් යටතේ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. එම පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද ඉහත කී චෝදනා පහ ඉදිරිපත් කිරීමට මුල්වී ඇති සිද්ධිය පහත දැක්වේ.

අභියාචක කොස්ගම පොලිස් ස්ථානයට අනුයුක්තව සිටියදී 2018.11.12 වෙනි දින, ඔහුගේ නිවසේ සිට රාජකාරී ස්ථානය වෙත මාවනැල්ල නගරය හරහා ගමන් කරන අවස්ථාවේ දී, බෝගස් හංදිය නැමැති ස්ථානයේ රථවාහන හැසිරවීමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් කොස්තාපල් 48739 මොහොමඩ් යන නිලධාරියාව, එම රාජකාරී ස්ථානයෙන් ඉවතට කැඳවා ඇත. ඉන්පසු එම නිලධාරියා ලවා, මැතිව්ස් හා රසික යන අය විසින් මිලදී ගෙන කොළඹ දක්වා රැගෙන යමින් සිටි SGLI 2357 දරණ ටිපර් රථය නවත්වා, එයට අදාළ බලපත්‍ර පරීක්ෂා කිරීමෙන් පසු, ටිපර් රථය විකුණූ පුද්ගලයින්ටම නැවත රැගෙන යාමට ඉඩ සලස්වා තිබූ බවට කරුණු ඉදිරිපත් කර ඇත. ඉහතින් සඳහන් කර ඇති පරිදි, චෝදනා සියල්ලම එම සිද්ධිය මත පදනම්ව ඇත.

විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂිකරුවන් 18 දෙනෙකු සාක්ෂියට කැඳවා ඇති බව විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ වාර්තාවේ සඳහන් වේ. ඉදිරිපත් වූ එක් එක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වෙන වෙනම පරීක්ෂාවට භාජනය කිරීමට පරීක්ෂණ නිලධාරියා ක්‍රියා කර ඇත. ඉන් අනතුරුව එක් එක් චෝදනාවට අභියාචක වරදකරු කිරීම සම්බන්ධයෙන් හේතු ද ඔහු විසින් පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි විශ්ලේෂණය කර, පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහුගේ තීරණයට එළඹ ඇත. ඉන් අනතුරුව ඉදිරිපත් කර ඇති චෝදනා පහටම අභියාචක වැරදිකරු බවට තීරනය කර ඇත.

ඉහත කී පරීක්ෂණ නිලධාරියාගේ සාක්ෂි විශ්ලේෂණය ඉහළ මට්ටමක පැවතී ඇත. ඒ අනුව ඔහු විසින් ගෙන ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත. කෙසේ වෙතත් විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි කෙරෙහි

විනිශ්චය අධිකාරයේ ද අවධානය යොමු කරන ලදි. ඊට අමතරව, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති දේශන වල සඳහන් කරුණු වලටද අවධානය යොමු කරන ලදි. එම දේශනයන්ට අනුව පැහැදිලිව පෙනී යන්නේ, සිද්ධියට අදාළ දිනයේදී අභියාචක ඔහුගේ රාජකාරී ස්ථානය වන කොස්ගම පොලිස් ස්ථානය බලා යන අතරතුරු දී, මාවනැල්ල බෝගස් හංදියේ රථවාහන හැසිරවීමේ රාජකාරියේ යෙදී සිටි මොහොමඩ් යන නිලධාරියාට දුරකථනයෙන් ඇමතූ බවයි. එසේ ඇමතීමෙන් අනතුරුව එම නිලධාරියා ලවා මැතිව්ස් සහ රසික යන අය විසින් මිලදී ගෙන රැගෙන යමින් සිටි ටිපර් රථය නැවැත්වීම සඳහා ඔහුට දැනුම් දුන් බවට පවසා ඇත. එසේ පවසන ලද්දේ, අභියාචකට පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලැබුණ ඔත්තුවක් නිසා බවටද ඔහු ප්‍රකාශ කොට ඇත. විධිමත් විනය පරීක්ෂණය අවසානයේ දි අභියාචක විසින් ප්‍රකාශයක් ලබා දී ඇත. එම ප්‍රකාශය සාක්ෂියක් ලෙස ලබා දී ඇති බවට සඳහන් කර ඇති නමුත්, එම ප්‍රකාශය හරස් ප්‍රශ්න වලට භාජනය වී නොමැත. එම ප්‍රකාශයෙහි අභියාචක සඳහන් කර ඇත්තේ, සැක සහිත ටිපර් රථයේ රියදුරු වන නිමල් යන අය, මොහොමඩ් යන නිලධාරියාට බලපත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ටිපර් රථය සොරකම් කිරීමකට යටත් වන බවට ඔහු තුළ සැකයක් ඇති වූ බවයි. ඒ අනුව ඔහු එම වාහනය පොලිස් ස්ථානයට රැගෙන යන ලෙසට දැන්වූ බවත්, ඔහු ප්‍රකාශ කොට ඇත. ඉන් අනතුරුව අභියාචක ද මාවනැල්ල පොලිස් ස්ථානයට ගිය බවට ඔහු ප්‍රකාශ කර ඇත.

ඉහත කී අභියාචකගේ ක්‍රියාවන් මතම පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක සිය රාජකාරියට වාර්තා කිරීම පසෙක තබා, වෙනත් පොලිස් කොට්ඨාශයකට අයත් ප්‍රදේශයක වී ඇති අපරාධයක් යයි කියනු ලබන ක්‍රියාවක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔහු මාවනැල්ල පොලිස් ස්ථානයට ද ගොස් ඇති බවයි. එයින්ම පෙනී යන්නේ, අභියාචක මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැරදි ක්‍රියා මාර්ගයකට එළඹ ඇති බවයි.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති දේශන වල සඳහන් කර ඇත්තේ, අභියාචක සමඟ අමනාපයෙන් සිටි පොලිස් අධිකාරී චාමික ප්‍රේමසිරි යන අයගේ මැදිහත්වීම මත අභියාචකට එරෙහිව මෙම චෝදනා ඉදිරිපත් කිරීමට සැලැස්වූ බවයි. නමුත් ඉහතින් සඳහන් සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි මඟින් තහවුරු වන්නේ, සත්‍ය වශයෙන්ම අභියාචක පෞද්ගලිකවම, මොහොමඩ් යන නිලධාරියාගේ රාජකාරියට මැදිහත් වී ක්‍රියාකර ඇති බවයි. අභියාචක ඔහුගේ දේශන වල සඳහන් කර ඇත්තේ, තිලකසිරි කුමාර යන අය විසින් ලබා දී තිබූ තොරතුරක් මත ඔහු මෙම ක්‍රියාවට සම්බන්ධ වූ බවයි. එකී

තිලකසිරි කුමාර යන අය සාක්ෂියට නොකැඳවීම සළකා බලා ඔහුගේ දඬුවම ඉවත් කරන ලෙසට ඉල්ලා ඇත. එවැනි සාක්ෂිකරුවෙක් සාක්ෂියට කැඳවා ගැනීමට අභියාචකට කිසිදු බාධාවක් තිබී නැත. මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයේ දී, පැමිණිල්ලේ සාක්ෂි විමසා අවසන් වීමෙන් පසුව, පරීක්ෂණ නිලධාරියා පැහැදිලි ලෙසට අභියාචකට දැනුම් දී ඇත්තේ, ඔහු වෙනුවෙන් සාක්ෂි කැඳවන්නේ නම්, ඒ සඳහා අවස්ථාව ඇති බවයි. අභියාචක ඔහු වෙනුවෙන් කිසිදු සාක්ෂිකරුවෙකු සාක්ෂියට කැඳවා නැත. ඔහු සාක්ෂියක් ලෙස ද ප්‍රකාශයක් පමණක් ලබා දී ඇති අතර, එය හරස් ප්‍රශ්න වලට භාජනය වී නැත. ඒ අනුව අභියාචක ඉදිරිපත් කර ඇති දේශන වල සඳහන් එම කරුණු මත ක්‍රියා කිරීමට හැකියාවක් නැත.

ඉහත සඳහන් හේතුන් සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචන නිශ්ප්‍රභ කිරීමට තිරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-